# කර්මාන්ත

## සමස්ත උපනතීන්

කර්මාන්ත අංශය 1994 දී ද සාමාන්‍ය වර්ධන ප්‍රවනතාවයන් පෙන්නුම් කරමින් අඛණ්ඩව වර්ධනය විය. 1993 වර්ෂයේ දී මූර්ත වශයෙන් සියයට 14 කින් වර්ධනය වූ කාර්මික නිමැවුම් වටිනාකම 1994 දී සියයට 9 කින් තව දුරටත් ප්‍රසාරණය විය. මෙම වර්ධනය සඳහා සියයට 11 කින් වර්ධනය වූ පෞද්ගලික අංශයේ කර්මාන්ත සම්පූර්ණයෙන්ම දයක විය. මුළු කාර්මික නිෂ්පාදනයෙන් නවයෙන් එකකට පමණ දායක වූ රාජ්‍ය අංශයේ කර්මාන්ත සියයට 5 ක පහත වැටීමක් වාර්තා කර ඇත.

පෞද්ගලික අංශය තුළ විශාල වර්ධනයක් වාර්තා කළ කාර්මික උප අංශයන් වූයේ ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන; රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන; දැව හා දැව නිෂ්පාදන; කඩදසි හා කඩදසි නිෂ්පාදන; සකස් කළ ලෝහ නිෂ්පාදන සහ ආහාර, පාන වර්ග හා දුම්කොළ යන නිෂ්පාදනයන්ය. කර්මාන්ත කිහිපයක අයිතිය රාජ්‍ය අංශයෙන් පෞද්ගලික අංශයට මාරුවීම හේතු කොට ගෙන ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන ගණයෙහි ඇති වූ තියුණු නිෂ්පාදන පහත වැටීම රාජ්‍ය අංශයේ කර්මාන්තවල නිෂ්පාදනය අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු විය.

1994 දී අපනයන මුල් කරගත් කර්මාන්තයන් සමස්තයක් ලෙස ගත්විට විගැහි වටිනාකම අනුව සියයට 11 ක වර්ධනයක් වාර්තා කර ඇත. කාර්මික අපනයන වටිනාකම 1993 දී රුපියල් දශලක්ෂ 100,420 සිට 1994 දී රුපියල් දශලක්ෂ 116,744 දක්වා වැඩි විය.

### නිෂ්පාදනය

කාර්මික නිමැවුම් වටිනාකම 1994 වර්ෂයේ දී මූර්ත වශයෙන් සියයට 9 කින් වැඩි වී ඇතැයි ඇස්තමේන්තු කර ඇත. 1994 දී නිෂ්පාදන වැඩිවීම් වාර්තා කළ කාර්මික උප අංශයන් වූයේ : මූලික ලෝහ නිෂ්පාදිත (සියයට 33); දැව හා දැව නිෂ්පාදිත (සියයට 16); කඩදසි හා කඩදසි නිෂ්පාදිත (සියයට 14); සකස් කළ ලෝහ නිෂ්පාදිත (සියයට 14); ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (සියයට 13); අන් තැනක සඳහන් නොවූ නිෂ්පාදිත (සියයට 13); රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත (සියයට 11); ආහාර, පාන වර්ග සහ දුම්කොළ (සියයට 8 ) සහ රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත (සියයට 6 ) යන අංශයන්ය.

### පෞද්ගලික අංශයේ කර්මාන්ත

1993 දී මූර්ත වශයෙන් සියයට 13 කින් වර්ධනය වූ පෞද්ගලික අංශයේ කර්මාන්තවල නිෂ්පාදන වටිනාකම 1994 දී තවදුරටත් සියයට 11 කින් වර්ධනය විය. ආහාර, පාන වර්ග සහ දුම්කොළ; රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදන; රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල් රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන සහ ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන යන කාර්මික නිෂ්පාදන ගණයන් හතරින් මෙම වර්ධනය විශාල වශයෙන් ජනිත විය.

රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදන උප අංශයෙහි නිෂ්පාදිතය මුළුමනින්ම ජනිත වූයේ පෞද්ගලික අංශයේ කර්මාන්ත තුළිනි. පසුගිය වසරේ සියයට 17 ක වර්ධනය හා සසඳන කල 1994 දී මෙම උප අංශයෙහි නිෂ්පාදනය සියයට 6 කින් වැඩි වී ඇත. පංගු ප්‍රමාණයන් පිළිබඳව ක්‍රමානුකූල සැලකිල්ලක් නොදක්වා ඇඟළුම් අංශයේ ඇති කරන ලද ඉහළ ධාරිතාවයන් එම කර්මාන්තයෙහි කාර්යක්ෂමතාවය හා ලාභදායීත්වය කෙරෙහි අහිතකරව බලපා ඇත. අපනයන මුල් කරගත් කර්මාන්ත සඳහා පැවති අඩු මිල ගණන් ඇඟළුම් අංශයෙහි වර්ධන ප්‍රවණතාවය පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු විය. රෙදිපිළි හා ඇඳුම් පැළඳුම් කර්මාන්තයන් කිහිපයක පැවති කම්කරු ආරවුල් ද මෙම අංශයෙහි ක්‍රියාකාරීත්වය කෙරෙහි අහිතකර ලෙස බලපෑවේය. වර්ෂය තුළදී ආයෝජන ප්‍රවර්ධන කලාපයට අයත් සම් භාණ්ඩ නිෂ්පාදන ව්‍යවසායයන්හි ඉහළ ක්‍රියාකාරීත්වය නිසා සම් භාණ්ඩ නිෂ්පාදනයන්හි කැපී පෙනෙන වර්ධනයක් වාර්තා විය.

1994 දී පෞද්ගලික අංශයේ කාර්මික නිෂ්පාදනයෙන් සියයට 26 කට පමණ දයක වූ ආහාර, පාන වර්ග හා දුම්කොළ ගණ යෙහි සියයට 8 ක වර්ධනයක් ඇති විය. මෙම කාර්මික උප අංශයෙහි වර්ධනය කිරි නිෂ්පාදන, විස්කෝතු, තිරිඟු පිටි, රස කැවිලි, සැකසූ පළතුරු, එළවළු සහ මාංශ නිෂ්පාදන යන අංශ වල ඉහළ, ක්‍රියාකාරිත්වය තුළින් නිරූපනය විය. කෙසේ වෙතත් ,ආහාර, පාන වර්ග සහ දුම්කොළ ගණයෙහි මුළු නිෂ්පාදනයට ප්‍රධාන වශයෙන් දයක වූ දුම්කොළ නිෂ්පාදනයෙහි පැවති කම්කරු ආරවුලක් සහ දේශීය ඉල්ලුම පහළ යාමත් නිසා 1994 දී මෙම ගණයෙහි නිෂ්පාදනයන්හි ආන්තික වශයෙන් අඩුවීමක් වාර්තා විය. ප්‍රධාන නිෂ්පාදන ආයතනයක කම්කරු ආරවුල් සත්ව කෑම නිෂ්පාදනය අඩුවීමට මූලික ලෙස හේතු විය.

1994 දී රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත ගණයෙහි මුළු නිෂ්පාදිතයෙන් අඩකට පමණ දයක වූයේ පෞද්ගලික අංශයේ කර්මාන්තවල නිෂ්පාදනයයි. කෘෂි රසායනික, බෙහෙත් වර්ග, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන, සබන් සහ පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය නිෂ්පාදනයෙහි නියැළුණු පෞද්ගලික අංශයේ කර්මාන්ත ඉහළ නිෂ්පාදන මට්ටමක් වාර්තා කර ඇත. 1994 දී කාර්මික හා චිකිත්සක අත්වැසුම් සහ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනයෙහි නියැළුණු අපනයන මුල් කරගත් ආයෝජන ප්‍රවර්ධන කලාපයට අයත් කර්මාන්ත ද ඉහළ ක්‍රියාකාරීත්වයක් වාර්තා කර ඇත.

ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන උප අංශයෙහි මුළු නිෂ්පාදිතයෙන් පහෙන් හතරකට පමණ දයක වූ පෞද්ගලික අංශයේ කර්මාන්ත 1994 දී අඛණ්ඩව ව්‍යාප්ත විය. ඉදිකිරීම් කටයුතුවල වර්ධනය නිසා ජනිත වූ ඉහළ ඉල්ලුම් ප්‍රමාණය සපුරාලීම සඳහා වීදුරු හා වීදුරු නිෂ්පාදන සහ ඇස්බැස්ටොස් නිෂ්පාදනයෙහි නියැලි පෞද්ගලික අංශයේ කර්මාන්තයන්හි ඉහළ නිෂ්පාදන මට්ටමක් වාර්තා විය. කෙසේ වෙතත් පසුගිය වසරේ සිත් ගන්නා සුළු වර්ධනයක් වාර්තා කළ පිහන් නිෂ්පාදන කර්මාන්තය තුල පැවති කම්කරු ආරවුල් හේතුවෙන් 1994 දී නිෂ්පාදනය පහත වැටුණි. ඩොලමයිට් නිෂ්පාදන, පෝසිලේන් ප්‍රතිමා සහ සකස් කළ කළුගල් කුට්ටි නිෂ්පාදනයෙහි නියැළුණු ආයෝජන ප්‍රවර්ධන කලාපයට අයත් කර්මාන්තයන්හි නිෂ්පාදන වල වර්ධනයක් පෙන්නුම් කර ඇත. අපනයන වල ඇති වූ අඩු වර්ධනය හේතු කොට ගෙන දියමන්ති කැපීමේ සහ ඔප දැමීමේ කර්මාන්තයන්හි ආන්තික වර්ධනයක් පමණක් වාර්තා විය.

කඩදසි හා කඩදසි නිෂ්පාදන උප අංශයේ නියැලි පෞද්ගලික අංශයේ කර්මාන්ත 1994 වර්ෂය තුළදී සියයට 16 ක වර්ධනයක් වාර්තා කර ඇත. මෙම වර්ධනය විශාල වශයෙන් ජනිත වූයේ මුද්‍රණ කටයුතු, කඩදසි හා කඩදසි නිෂ්පාදන, ලේබල් සහ ඇසුරුම් ද්‍රව්‍ය කර්මාන්තයන් තුළිනි.

පසුගිය වසරේදී දුර්වල ක්‍රියාකාරීත්වයක් වාර්තා කළ සකස් කළ ලෝහ නිෂ්පාදන උප අංශය 1994 දී සැළකිය යුතු නිෂ්පාදන වර්ධනයක් පෙන්නුම් කර ඇත. 1994 දී සකස් කළ ලෝහ නිෂ්පාදන අංශයෙහි වැඩි වූ වර්ධනය විශාල වශයෙන් ජනිත වූයේ සකස් කළ ලෝහ, විද්‍යුත් උපකරණ, බැටරි, කේබල් සහ විදුලි බුබුළු නිෂ්පාදනයෙහි නියැළුණු පෞද්ගලික අංශයේ කර්මාන්තයන්ගෙනි. බස් සහ ලොරි බොඩි සෑදීමේ කර්මාන්තයන්හි නියුක්ත පෞද්ගලික අංශයේ කර්මාන්ත ද ඉහළ නිෂ්පාදන මට්ටමක් වාර්තා කර ඇත.

පසුගිය වසරේ සාමාන්‍ය වර්ධනයක් පෙන් වූ අන් තැනක සඳහන් නොවූ නිෂ්පාදිතයන්හි සිත් ගන්නා සුළු වර්ධනයක් 1994 දී වාර්තා විය. මෙම වර්ධනය විශාල වශයෙන් ජනිත වූයේ කොහු කෙඳි නිෂ්පාදන, මෙට්ට, මාළු දැල් හා ආම්පන්න, බුරුසු සහ ස්වර්ණාභරණ නිෂ්පාදනයෙහි යෙදී සිටි කර්මාන්ත වලිනි.

## රාජ්‍ය අංශයේ කර්මාන්ත

මූර්ත වටිනාකම අනුව පසුගිය වර්ෂයේ සියයට 20 ක වර්ධනය හා සැසඳීමේදී 1994 වර්ෂයේ දී රාජ්‍ය අංශයේ කාර්මික නිමැවුම සියයට 5 කින් පහත වැටුනි. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ රාජ්‍ය අංශය යටතේ තිබූ සිමෙන්ති සහ පිහන් නිෂ්පාදන ඒකකවල අයිතිය 1993

දෙසැම්බර් මාසයේදී පෞද්ගලික අංශයට මාරු කිරීම හේතුකොට ගෙන ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත කාර්මික ගණයේ නිමැවුම තියුණු ලෙස පහත වැටීමය. රාජ්‍ය අංශයේ කාර්මික නිෂ්පාදිත වටිනාකමෙන් සියයට 78 කට පමණ දයක වූ ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ නිෂ්පාදිත වටිනාකම 1994 වර්ෂයේදී සියයට 4 කින් වැඩි විය. ඛනිජ තෙල් නිෂ්පාදිත වටිනාකම බැහැර කළ විට රාජ්‍ය අංශයේ කාර්මික නිමැවුම සියයට 33 කින් පහත වැටුනු බවට ඇස්තමේන්තු කර ඇත.

1.18 සංඛ්‍යා සටහන

**රාජ්‍ය අංශයේ ප්‍රධාන කර්මාන්ත නිමැවුම් දර්ශකය 1992 - 1994**
**(1977-100)**

| කාර්මික ගණය | 1992 | 1993 | 1994(අ) |
|---|---|---|---|
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 13.4 | 8.1 | 9.3 |
| 2. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත | 27.5 | 10.3 | - |
| 3. දැව හා දැව නිෂ්පාදිත | 20.3 | 25.4 | 22.0 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 156.6 | 174.1 | 187.8 |
| 5. රසායනික නිෂ්පාදිත | 86.9 | 121.8 | 126.3 |
| 5.1 ඛනිජ තෙල් නිෂ්පාදිත | 91.8 | 129.4 | 134.2 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 143.4 | 120.0 | 5.5 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 125.7 | 92.4 | 130.8 |
| සියළුම ගණයයන් | 73.3 | 87.9 | 83.8 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත හැර | 52.7 | 41.7 | 27.7 |

(අ) තාවකාලික.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

රාජ්‍ය දැව සංස්ථාව (සියයට 13) සහ ලංකා පොස්පේට් ලිමිටඩ් (සියයට 11) යන ව්‍යවසායයන්හී නිමැවුමේ පහත වැටීම් වාර්තා විය.

වර්ෂය තුළදී රජයේ ජනතාකරණ වැඩසටහන යටතේ සීමාසහිත වයඹ කෘෂි පොහොර සමාගම, සීමාසහිත රුහුණු කෘෂි පොහොර සමාගම සහ සීමාසහිත ලංකා ලුබ්රිකන්ට්ස් සමාගම යන ආයතනවල අයිතිය රාජ්‍ය අංශයේ සිට පෞද්ගලික අංශයට මාරු කරන ලදී.

දැව කැපීමේ කටයුතු අඩු මට්ටමක පැවතීමේ හේතුවෙන් ප්‍රමාණවත් ආකාරයට දැව නොතිබීම නිසා රාජ්‍ය දැව සංස්ථාවේ නිමැවුම පහත වැටුණි. දේශීය වෙළෙඳ පොලේ අලෙවිය අඩු වීම ලංකා පොස්පේට් සමාගමේ නිෂ්පාදනය අඩුවීමට හේතු විය.

සීමාසහිත ලංකා වානේ සංස්ථාව (සියයට 42), ලංකා සෝල්ට් ලිමිටඩ් (සියයට 15), සීමාසහිත සෙවනගල සීනි නිෂ්පාදන සමාගම (සියයට 15), නැෂනල් පේපර් කම්පැනි ලිමිටඩ් (සියයට 15), සීමාසහිත ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන සමාගම (සියයට 5) සහ ලංකා ඛනිජ තෙල් සංස්ථාව (සියයට 4) යන රාජ්‍ය අංශයේ කාර්මික ව්‍යවසායයන් වර්ෂය තුලදී නිෂ්පාදන වැඩිවීම් වාර්තා කරන ලදී. අමුද්‍රව්‍ය සැපයුම ප්‍රමාණවත් මට්ටමක පැවතීම නිසා ලංකා වානේ සංස්ථාවේ නිමැවුම වැඩි විය. වර්ෂය තුලදී සීමාසහිත සෙවනගල සීනි නිෂ්පාදන සමාගමේ නිෂ්පාදනය වැඩි වීමට ප්‍රධාන හේතුව වූයේ එම කර්මාන්තායතනයට ලබා ගත හැකි වූ උක් දඩු ප්‍රමාණය වැඩිවීමයි. අස්වනු නෙලා ගන්නා කාලය තුළදී පැවති වියළි කාලගුණික තත්ත්වය ලංකා සොල්ට් ලිමිටඩ්හි නිමැවුම වැඩිවීමට හේතු විය. කඩදාසි නිෂ්පාදිතයන් සඳහා පැවති ඉහළ ඉල්ලුම හේතුකොට ගෙන වාලච්චේනේ කම්හලේ ඉහළ ධාරිතා උපයෝජන මට්ටමක් පවත්වා ගැනිම නිසා නැෂනල් පේපර් කොම්පැනි ලිමිටඩ්හි නිමැවුම වැඩි විය.

රාජ්‍ය ව්‍යවසායයන්හි ආංශික වර්ගීකරණය අනුව මූලික ලෝහ නිෂ්පාදිත අංශය වැඩිම වර්ධන ප්‍රතිශතය (සියයට 42) වාර්තා කළේය. ආහාර, පාන වර්ග සහ දුම්කොළ (සියයට 15); කඩදාසි සහ කඩදාසි නිෂ්පාදිත (සියයට 8) සහ රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික්

නිෂ්පාදිත (සියයට 4) ඉහළ තිමැවුම් මට්ටම් වාර්තා කළ අනෙකුත් අංශයයන් විය. ලෝහ නොවන බනිජ නිෂ්පාදිත (සියයට 95) සහ දැව හා දැව නිෂ්පාදිත (සියයට 13) යන අංශයන් නිමැවුමේ පහත වැටීම් වාර්තා කළේය.

## පවත්නා මිළ ගණන් අනුව නිෂ්පාදන වටිනාකම

පවත්නා මිළ ගණන් අනුව 1994 වර්ෂයේදී සමස්ත කාර්මික නිෂ්පාදන වටිනාකම සියයට 15 කින් වැඩි වූ බවට ඇස්තමේන්තු කර ඇත. දැව හා දැව නිෂ්පාදිත වටිනාකම සියයට 30 කින් ද; මූලික ලෝහ නිෂ්පාදිත සියයට 28 කින් ද; අන් තැනක සඳහන් නොවූ කාර්මික නිෂ්පාදිත සියයට20 කින් ද; සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍රෝපකරණ සහ ප්‍රවාහන උපකරණ සියයට 20 කින් ද; කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත සියයට 18 කින්ද; ලෝහ නොවන බනිජ නිෂ්පාදිත සියයට 18 කින්ද; රසායනික ද්‍රව්‍ය, බනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත සියයට 18 කින් ද; රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත සියයට 12 කින් සහ ආහාර, පාන වර්ග සහ දුම්කොළ සියයට 14 කින්ද නිෂ්පාදන වටිනාකම වැඩි විය.

1.19 සංඛ්‍යා සටහන

**කාර්මික නිෂ්පාදන වටිනාකම 1990 - 1994**
**(පවත්නා මිළ ගණන් අනුව)**

(රුපියල් දශලක්ෂ)

| | කාර්මික ගණය | 1990 | 1991 | 1992 | 1993 (ආ) | 1994 (අ) |
|---|---|---|---|---|---|---|
| 1. | ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 21,955 | 30,003 | 34,157 | 39,709 | 45,054 |
| 2. | රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත | 27,930 | 33,854 | 53,929 | 70,057 | 78,211 |
| 3. | දැව හා දැව නිෂ්පාදිත (ගෘහ භාණ්ඩ ඇතුළුව) | 721 | 802 | 1,005 | 1,230 | 1,601 |
| 4. | කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 1,880 | 2,214 | 2,586 | 3,438 | 4,066 |
| 5. | රසායනික ද්‍රව්‍ය, බනිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 21,215 | 20,140 | 23,817 | 28,876 | 34,017 |
| 6. | ලෝහ නොවන බනිජ තෙල් නිෂ්පාදිත | 7,554 | 8,181 | 10,582 | 12,351 | 14,580 |
| 7. | මූලික ලෝහ නිෂ්පාදිත | 1,006 | 1,264 | 1,424 | 1,497 | 1,909 |
| 8. | සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 4,199 | 5,093 | 5,948 | 5,915 | 7,122 |
| 9. | අන් තැනක සඳහන් නොවූ නිෂ්පාදිත | 296 | 2,373 | 2,658 | 3,402 | 4,083 |
| | එකතුව | 86,756 | 103,924 | 136,106 | 166,475 | 190,643 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) තාවකාලික.
(ආ) සංශෝධිත.

## එකතු වූ අගය

පවත්නා මිළ ගණන් අනුව, පසුගිය වර්ෂයේ සියයට 21 ක වර්ධනය හා සැසඳීමේ දී 1994 වර්ෂයේදී කර්මාන්තයන්හි එකතු වූ අගය සියයට 15 කින් වැඩි විය. අමුද්‍රව්‍ය, බලය සහ ඉන්ධන වියදම් කර්මාන්ත ශාලාවෙන් පිටවන විට නිමවුමේ වටිනාකමෙන් අඩු කිරීම තුලින් එකතු වූ අගය ලබා ගනු ලැබේ.

1.20 සංඛ්‍යා සටහන

**කර්මාන්ත අංශයේ එකතු වූ අගය 1990 - 1994**

රුපියල් දශලක්ෂ

| කාර්මික ගණය | 1990 | 1991 | 1992 | 1993(ආ) | 1994 (අ) |
|---|---|---|---|---|---|
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 12,065 | 15,070 | 18,668 | 21,704 | 24,373 |
| 2. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත | 7,167 | 8,542 | 14,630 | 18,994 | 20,660 |
| 3. දැව හා නිෂ්පාදිත (ගෘහ භාණ්ඩ ඇතුළුව) | 485 | 571 | 677 | 831 | 1,081 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 1,019 | 1,167 | 1,397 | 1,912 | 2,301 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 2,428 | 3,199 | 3,989 | 4,723 | 5,758 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ඛනිජ තෙල් සහ ගල් අඟුරු හැර) | 4,742 | 4,905 | 5,918 | 7,163 | 9,272 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 194 | 248 | 263 | 279 | 356 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 2,746 | 3,247 | 3,629 | 3,608 | 4,344 |
| 9. අන් තැනක සඳහන් නොවූ නිෂ්පාදිත | 138 | 1,092 | 1,196 | 1,532 | 1,838 |
| එකතුව | 30,984 | 38,041 | 50,367 | 60,746 | 69,983 |

(අ) තාවකාලික.
(ආ) සංශෝධිත.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

1994 දී නිෂ්පාදන කර්මාන්තවල එකතු වූ අගයෙහි සමස්ත වටිනාකම රුපියල් දශලක්ෂ 69,983 ක් විය. එකතු වූ අගය නිෂ්පාදන වටිනාකමේ ප්‍රතිශතයක් වශයෙන් ගත් විට, පසුගිය වර්ෂයේ සියයට 36 හා සැසඳීමේදී 1994 වර්ෂයේදී සියයට 37 ක් විය. දැව හා දැව නිෂ්පාදිත (සියයට 68), ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (සියයට 64), සකස් කළ ලෝහ නිෂ්පාදිත (සියයට 61), කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත (සියයට 57) සහ ආහාර, පාන වර්ග සහ දුම්කොළ (සියයට 54) යන කාර්මික ගණයන්හි එකතු වූ අගයේ අනුපාතය සියයට 50 ට වඩා වැඩි විය. මෙම අනුපාතය සියයට 50 ට අඩු වූ කාර්මික ගණයන් වූයේ අන් තැනක සඳහන් නොවූ නිෂ්පාදිත (සියයට 45); රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම්නිෂ්පාදිත (සියයට 26); මූලික ලෝහ නිෂ්පාදිත (සියයට 19) සහ ඛනිජ තෙල් සහ රසායනික ද්‍රව්‍ය (සියයට 17) යන කාර්මික ගණයන්ය.

## බලය සහ ඉන්ධන

ලංකා විදුලිබල මණ්ඩලයට කරන ලද විකුණුම් අත් හළ විට 1994 වර්ෂයේදී කාර්මික ඉන්ධන අලෙවි වටිනාකම සියයට 10 කින් වැඩි විය. උදුන් තෙල් අලෙවිය සහ බැර ඩීසල් අලෙවිය පිළිවෙලින් සියයට 9 කින් සහ සියයට 22 කින් වැඩි විය.

1.21 සංඛ්‍යා සටහන

**කර්මාන්තයන්හි බලය හා ඉන්ධන භාවිතය 1993 - 1994**

| අයිතම | 1993 (ආ) | 1994 (අ) |
|---|---|---|
| 1. විදුලි බල (ගිගවොට් පැය) (ඇ) | 1,218.1 | 1,314.0 |
| 1.1 කුඩා කර්මාන්ත | 84.4 | 98.0 |
| 1.2 මධ්‍යම කර්මාන්ත | 622.9 | 632.0 |
| 1.3 විශාල කර්මාන්ත | 510.8 | 584.0 |
| 2. කාර්මික ඉන්ධනවල දේශීය අලෙවිය (මෙ.ටො.ද.) (ඈ) | 193.9 | 214.0 |
| 2.1 බැර ඩීසල් | 18.0 | 21.9 |
| 2.2 උදුන් තෙල් | 175.9 | 192.1 |

මූලයයන් : ලංකා විදුලි බල මණ්ඩලය,
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව.

(අ) තාවකාලික.

(ආ) සංශෝධිත.

(ඇ) කාර්මික නිෂ්පාදන හා අපනයන සැකසුම් කර්මාන්තද ඇතුලත් ය. වෝල්ට 400/230 බලයකින් සපයන්නා වූ සහ ගිවිස ගත් අවශ්‍යතාවය දහසු වෝල්ට ඇම්පියර් 50 ට අඩු ඉල්ලුමක් ඇති කර්මාන්ත කුඩා කර්මාන්ත වශයෙන් ද, වෝල්ට 400/230 බලයකින් සපයන්නා වූ සහ ගිවිස ගත් අවශ්‍යතාවය දහසු වෝල්ට ඇම්පියර් 50 ට සමාන හෝ වැඩි ඉල්ලුමක් ඇති කර්මාන්ත මධ්‍යම කර්මාන්ත වශයෙන් ද, දහසු වෝල්ට 11, 33 සහ132 අධි බලයකින් විදුලිය සපයන්නා වූ කර්මාන්ත විශාල කර්මාන්ත වශයෙන් ද නිර්වචනය කෙරේ.

(ඈ) ලංකා විදුලිබල මණ්ඩලයට හැර සෙසු ආයතන වලට කෙරුනු විකිණීම්

1994 වර්ෂය තුළදී කර්මාන්ත අංශයේ විදුලිබල භාවිතය සියයට 8 කින් වැඩි විය. මෙම වර්ධනය කුඩා පරිමාණ කර්මාන්තයන්හි සියයට 16 ක, මධ්‍යම පරිමාණ කර්මාන්තයන්හි සියයට 1 ක සහ විශාල පරිමාණ කර්මාන්තයන්හි සියයට 14 ක සංකලනයකි.

## කාර්මික ප්‍රතිපත්තිය

විමසුමට ලක් වූ වර්ෂය තුලදී ප්‍රාදේශීය පදනමක් මත කර්මාන්ත සඳහා වඩා උසස් මට්ටමක යටිතල පහසුකම් ලබාදීමේ කටයුතු රජය විසින් දිගටම පවත්වාගෙන යන ලදී. 1994 අප්‍රියෙල් මාසයේදී සිවුවැනි ආයෝජන ප්‍රවර්ධන කලාපය මධ්‍යම පලාතේ පල්ලෙකැලේ පිහිටුවන ලදී. දේශීය හා විදේශීය පෞද්ගලික ආයෝජකයන්ගේ සහයෝගිත්වයෙන් රටේ විවිධ ප්‍රදේශවල කාර්මික ජනපද / කලාප පිහිටුවීමේ වැඩසටහන රජය විසින් ආරම්භ කරනු ලැබීය. කාර්මික අංශය තුළ විද්‍යාව සහ තාක්ෂණය භාවිතයට ගැනීම වැඩි දියුණු කිරීමේ අරමුණෙන් 1994 මැයි මාසයේදී කැබිනට් මණ්ඩලය විසින් විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනත අනුමත කරන ලදී.

විමර්ශනයට භාජනය වූ වර්ෂය තුළ දී බදු ප්‍රතිසංස්කරණ කිහිපයක් රජය විසින් හඳුන්වා දෙන ලදී. 1994 අප්‍රේල් සිට බලපැවැත්වෙන පරිදි නව ආයෝජන ප්‍රවර්ධනය කිරීමේ අරමුණෙන් ආයතනික බද්ද සියයට 40 සිට සියයට 35 දක්වා අඩු කරන ලදී. ආයෝජන මණ්ඩලය යටතේ ඇති ව්‍යවසායයන් සඳහා මෙතෙක් පැවති සහනදායී බදු කාලයන් වෙනුවට සියයට 15 ක වරණ බදු අනුපාතයක් 1994 අප්‍රේල් මස සිට බලපැවැත්වෙන පරිදි ඇති කරන ලදී.

විමර්ශිත වර්ෂය තුළදී පෞද්ගලීකරණය පිළිබඳ රජයේ ප්‍රතිපත්තිය අනුව, සීමාසහිත වයඹ කෘෂි පොහොර, සීමාසහිත රුහුණු කෘෂි පොහොර සහ සීමාසහිත ලංකා ලුබ්රිකන්ට්ස් යන සමාගම්වල සියයට 90 ක් නියෝජනය වන බහුතර කොටස් ප්‍රමාණයක් පිළිවෙලින් රුපියල්

දශලක්ෂ 20.5, රුපියල් දශලක්ෂ 22.9 සහ රුපියල් දශලක්ෂ 239.1 ක වටිනාකම්වලට කැබිනට් මණ්ඩලය පත්කල ටෙන්ඩර් මණ්ඩල මගින් විකුණනු ලැබීය.

## කර්මාන්ත සඳහා ඇති පහසුකම්

විමසුමට ලක් වූ වර්ෂය තුළදී කර්මාන්ත අංශයට සහනදායී කොන්දේසි මත මූල්‍ය ආධාර නොකඩවා ලැබුණි. ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් අරමුදල් සපයන ලද ජාතික සංවර්ධන බැංකුවේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ව්‍යාපෘති සඳහා ඇති ණය යෝජනා ක්‍රමය (සු. ම. ක.) කර්මාන්තවලට මූල්‍ය ආධාර ලබාදුන් ප්‍රධාන මූල්‍ය වැඩපිළිවෙල විය. මෙයට අමතරව ලංකා සංවර්ධන මූල්‍ය සමායතනය (ලං.සං.මූ.ස.), ජාතික සංවර්ධන බැංකුව (ජා. සං. බැං) සහ අනෙකුත් වාණිජ බැංකු කර්මාන්තකරුවන් සඳහා ණය සහ ප්‍රාග්ධන සහභාගිත්වය තුළින් සෘජු මූල්‍ය පහසුකම් සපයන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුව 1994 දෙසැම්බර් අවසානය වන විට රුපියල් දශලක්ෂ 5,063 ක ණය මුදල් ආවරණය කරමින් කුඩා පරිමාණයේ කර්මාන්ත සහ සුළු හා මධ්‍ය පරිමාණයේ කර්මාන්ත ණය යෝජනා ක්‍රමය යටතේ (සු. ම. ක.) I, II, III සහ IV වෙනුවෙන් ඇප ආවරණ 14,368 නිකුත් කර තිබුණි. වර්ෂය අවසානය වන විට නිකුත් කළ ණය 4,578 ක් සඳහා වූ රුපියල් දශලක්ෂ 3,737 න් රුපියල් දශලක්ෂ 1,450 ක් සම්පූර්ණයෙන් ආපසු අයකර ගෙන තිබුණි. නොපියවන ලද ණය සම්බන්ධව සලකන කල, ප්‍රදානය කරන ලද ණය 8,167 ක් වෙනුවෙන් රුපියල් දශලක්ෂ 233 ක් හිඟව පැවතුනි. 1994 වර්ෂය අවසන් වන විට හිමිකම් පෑම් 502 පියවීම වෙනුවෙන් රුපියල් දශලක්ෂ 75 ක් මහ බැංකුව ගෙවා තිබුණි.

ජාතික සංවර්ධන බැංකුව (ජා. සං. බැ.) ණය සහ ප්‍රාග්ධන සහභාගිත්වය මගින් කාර්මික ව්‍යාපෘතිවලට සෘජු මූල්‍ය ආධාර සැපයීය. ජාතික සංවර්ධන බැංකුව 1993 දී රුපියල් දශලක්ෂ 4,114 ක සෘජු මූල්‍ය ආධාර සපයමින් අනුමත කරන ලද ව්‍යාපෘති 262 හා සැසඳීමේදී 1994 දී රුපියල් දශලක්ෂ 5,417 ක සෘජු හා මූල්‍ය ආධාර සපයමින් ව්‍යාපෘති 352 ක් අනුමත කරන ලදී. විමසුමට ලක් වූ වර්ෂය තුළදී ජා. සං. බැ. ව්‍යාපෘති 22 ක් සඳහා රුපියල් දශලක්ෂ 281 ක ප්‍රාග්ධන දායකත්වයක් සැපයීය. රසායනික ද්‍රව්‍ය, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත; ආහාර, පාන වර්ග සහ දුම්කොළ; රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත හා මූලික ලෝහ නිෂ්පාදිත යන කාර්මික ගණයයන් මෙම පහසුකම් වලින් වැඩි කොටසක් ලබාගත් අංශයන් විය.

ලංකා සංවර්ධන මූල්‍ය සමායතනය ව්‍යාපෘති 304 ක් අනුමත කරමින් කර්මාන්ත අංශය සඳහා ණය සහ ප්‍රාග්ධන සහභාගිත්වය වශයෙන් රුපියල් දශලක්ෂ 2,501 ක් සපයන ලදී. මෙම මූල්‍ය පහසුකම් වලින් ප්‍රධාන කොටසක් ලබාගත් කාර්මික ගණයයන් වූයේ : සකස් කළ ලෝහ නිෂ්පාදිත; ආහාර, පාන වර්ග සහ දුම්කොළ; රසායනික ද්‍රව්‍ය, රබර් හා ප්ලාස්ටික් සහ රෙදිපිළි, ඇඳුම් පැළඳුම් හා සම් නිෂ්පාදිත යන ඒවාය.

1994 වර්ෂය තුළදී වාණිජ බැංකු ද කර්මාන්ත අංශය සඳහා මූල්‍ය පහසුකම් සැපයීම නොකඩවා කරගෙන යනු ලැබීය. 1994 වර්ෂයේ මුල් මාස නමය තුළදී කාර්මික අංශයට සැපයුනු වාණිජ බැංකු අත්තිකාරම් සියයට 6 ක වැඩිවීමක් පෙන්නුම් කරමින් 1993 දෙසැම්බර් අවසානයේදී පැවති රුපියල් දශලක්ෂ 18,450 සිට 1994 සැප්තැම්බර් අවසානයේදී රුපියල් දශලක්ෂ 19,508 දක්වා ඉහළ ගියේය.

## පෞද්ගලික විදේශ ආයෝජනය

"ඒකීය ආයෝජන ප්‍රවර්ධන මධ්‍යස්ථානය" ලෙස ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (ශ්‍රී. ල. ආ. ම.) නොකඩවා ක්‍රියාත්මක විය. ශ්‍රී ලංකා ආයෝජන මංඩල පනතේ 17 වන වගන්තිය (විශේෂ දිරි ගැන්වීම් යෝජනා ක්‍රමය) යටතේ 1994 වර්ෂය තුළදී ශ්‍රී. ල. ආ. මණ්ඩලය ව්‍යාපෘතීන් 291 ක් අනුමත කළ අතර වර්ෂය අවසාන වන විට අනුමත කළ මුළු ව්‍යාපෘතීන් සංඛ්‍යාව 1,482 දක්වා වැඩි විය. මෙයින් ව්‍යවසායයන් 993 ක් විවිධ කර්මාන්ත ආරම්භ කිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුම් ඇති කර ගෙන ඇත.

## 1.22 සංඛ්‍යා සටහන

## 1994 දි ජාතික සංවර්ධන බැංකුව සහ ලංකා සංවර්ධන මූල්‍ය සමායතනය විසින් සැපයීමට අනුමැතිය දි ඇති ණය මූල්‍ය පහසුකම් සහ ප්‍රාග්ධන සහභාගිත්වය

| කාර්මික ගණය | ජා.ස.බැ. | | | | | | | | ල.ස.මූ.ස | | | | | | මුළු එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රතිමූල්‍ය අනුමත කිරීම් IV සු.ම.ක. යෝජනා ක්‍රමය | | සෘජු මූල්‍ය පහසුකම් | | ප්‍රාග්ධන සහභාගීත්වය | | එකතුව | | ණය අනුමත කිරීම් | | ප්‍රාග්ධන සහභාගීත්වය | | එකතුව | | | |
| | සංඛ්‍යාව | වටිනාකම රුපියල් දශලක්ෂ | සංඛ්‍යාව | වටිනාකම රුපියල් දශලක්ෂ | සංඛ්‍යාව | වටිනාකම රුපියල් දශලක්ෂ | සංඛ්‍යාව | වටිනාකම රුපියල් දශලක්ෂ | සංඛ්‍යාව | වටිනාකම රුපියල් දශලක්ෂ | සංඛ්‍යාව | වටිනාකම රුපියල් දශලක්ෂ | සංඛ්‍යාව | වටිනාකම රුපියල් දශලක්ෂ | | |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 134 | 69 | 35 | 564 | - | - | 169 | 633 | 75 | 463 | 1 | 1 | 76 | 464 | 245 | 1097 |
| 2. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත | 71 | 53 | 42 | 402 | 3 | 94 | 116 | 549 | 56 | 311 | - | - | 56 | 311 | 172 | 860 |
| 3. දැව හා දැව නිෂ්පාදිත | 54 | 43 | 12 | 61 | 1 | - | 67 | 104 | 26 | 81 | - | - | 26 | 81 | 93 | 185 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 41 | 41 | 1 | 64 | - | - | 42 | 105 | 28 | 221 | - | 2 | 28 | 223 | 70 | 328 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛණිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 38 | 70 | 76 | 728 | 7 | 48 | 121 | 846 | 59 | 477 | 3 | 7 | 62 | 484 | 183 | 1330 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 24 | 10 | - | - | - | - | 24 | 10 | 19 | 255 | 2 | 66 | 21 | 321 | 45 | 331 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 53 | 50 | 9 | 156 | - | - | 62 | 206 | 5 | 16 | - | - | 5 | 16 | 67 | 222 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 148 | 90 | - | - | - | - | 148 | 90 | 36 | 264 | 1 | 337 | 37 | 601 | 185 | 691 |
| 9. අන් තැනක සඳහන් නොවූ නිෂ්පාදිත | 331 | 274 | 177 | 3,442 | 11 | 139 | 519 | 3,855 | - | - | - | - | - | - | -519 | 3855 |
| එකතුව | 894 | 700 | 352 | 5417 | 22 | 281 | 1268 | 6,398 | 304 | 2088 | 7 | 413 | 311 | 2501 | 1579 | 8899 |

මූලයන් : ජාතික සංවර්ධන බැංකුව.
ලංකා සංවර්ධන මූල්‍ය සමායතනය.

1994 වර්ෂය අවසාන වන විට, වාණිජමය නිෂ්පාදන කටයුතුවල නියැලී සිටි ව්‍යවසායයන්ගේ සංඛ්‍යාව 442 ක් විය. නිෂ්පාදන කටයුතු ආරම්භ කර තිබූ ව්‍යවසායයන් අතුරින් 92 ක් කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපය (ක.ආ.ප්‍ර.ක.) තුළද, 38 ක් බියගම ආයෝජන ප්‍රවර්ධන කලාපය (බි. ආ. ප්‍ර. ක.) තුළද, 11 ක් කොග්ගල ආයෝජන ප්‍රවර්ධන කලාපය (කො. ආ. ප්‍ර. ක.) තුළද, 301 ක් දිවයිනේ සෙසු ප්‍රදේශවලද පිහිටුවා තිබුණි.

1994 වර්ෂය අවසාන වන විට කර්මාන්ත අංශය තුළ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ පවතින ව්‍යාපෘතීන්හි සැළකිය යුතු නව ආයෝජනයන් ප්‍රමාණයක් වාර්තා ගත විය. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුම් ඇති කරගෙන සිටි ආයතන අතරින් ආයතන 449 විසින් 1994 දෙසැම්බර් මස අවසන් වන විට ආයෝජනය කර තිබූ මුදල රුපියල් දශලක්ෂ 46,959 ක් විය. මෙම අයෝජනයන්හි විදේශ ආයෝජන සංයුතිය රුපියල් දශලක්ෂ 28,238 ක් වූ අතර එය මුළු ආයෝජන ප්‍රමාණයෙන් සියයට 60 ක් විය. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත; රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්,රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත සහ අන් තැනක සඳහන් නොවූ කාර්මික නිෂ්පාදිත යන අංශයන් මුළු ආයෝජනයෙන් පිළිවෙලින් සියයට 17,සියයට 9 සහ සියයට 5 ක් වශයෙන් අවශෝෂණය කරගන්නා ලදී.

1.23 සංඛ්‍යා සටහන

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ව්‍යවසායයන් විසින් දැනට කර ඇති ආයෝජනයන් (අ)**

| කාර්මික ගණය | ව්‍යවසායයන් ගණන | විදේශ ආයෝජනය (රු.ද.ලක්ෂ) | දේශීය ආයෝජනය (රු.ද.ලක්ෂ) | මුළු අයෝජන (ආ) (රු. දශලක්ෂ) |
|---|---|---|---|---|
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 29 | 397 | 480 | 877 |
| 2. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත | 97 | 6,593 | 1,615 | 8,208 |
| 3. දැව හා දැව නිෂ්පාදිත | 11 | 331 | 24 | 356 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 7 | 171 | 54 | 225 |
| 5. රසායනික ද්‍රව්‍ය, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 47 | 3,886 | 722 | 4,608 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 37 | 862 | 1,328 | 2,190 |
| 7. සකස් කළ ලෝහ නිෂ්පාදිත | 15 | 295 | 158 | 452 |
| 8. අන් තැනක සඳහන් නොවූ නිෂ්පාදිත | 68 | 1,728 | 542 | 2,271 |
| 9. සේවා (අලංකාරය සඳහා වවන ශාක ඇතුළුව) | 137 | 13,975 | 13,798 | 27,772 |
| එකතුව | 449 | 28,238 | 18,721 | 46,959 |

මූලය :ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය.

(අ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ අනුමත ව්‍යාපෘති.
(ආ) 1994 දෙසැම්බර් 31 දක්වා.

1994 වර්ෂය අවසාන වන විට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ඇති ව්‍යවසායයන්හි නියුතු මුළු සේවක සංඛ්‍යාව (ඇඟළුම් කම්හල් 200 ව්‍යාපෘතීන්හි හැර) 1,34,572 ක් වූ අතර 1994 වසරේ එහි වර්ධනය සියයට 10 ක් විය. මෙම සංඛ්‍යාවෙන් පුද්ගලයන් 73,045 ක් රෙදිපිළි,ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදන අංශයේ යෙදී සිටියහ. මෙම අංශයේ ව්‍යවසායයන්ගේ සාපේක්ෂ සේවා නියුක්තිය 1993 වසරේදී පැවති සියයට 57 සිට 1994 වසරේදී සියයට 54 දක්වා අඩු විය. 1994 වර්ෂය අවසානය වන විට ඇඟළුම් කම්හල් 200 ව්‍යාපෘතියේ සේවයේ නියුතු සංඛ්‍යාව 71,088 ක් විය. රැකියා උත්පාදනයේ ඉහළ අනුපාතයන් වාර්තා කරන ලද්දේ රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත; අන් තැනක සඳහන් නොවූ කාර්මික නිෂ්පාදිත සහ ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත යන කාර්මික ගණයයන්හිය.

1.24 සංඛ්‍යා සටහන

## ආයෝජන ප්‍රවර්ධක කලාප-සේවා නියුක්තිය සහ අපනයන ඉපැයුම් 1993 - 1994

| කාර්මික ගණය | 1993 | | 1994 (අ) | |
|---|---|---|---|---|
| | සේවා නියුක්තිය (දෙසැම්බර් අවසානයට සංඛ්‍යාව) | දළ අපනයන ඉපැයුම් (නැ.වි.සඃ) රු.දශ.ලක්ෂ | සේවා නියුක්තිය (දෙසැම්බර් අවසානයට සංඛ්‍යාව) | දළ අපනයන ඉපැයුම් (නැ.වි.ස.) රු.දශ.ලක්ෂ |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 3,094 | 2,838 | 4,105 | 3,032 |
| 2. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත | 127,665 (ආ) | 56,890 | 144,131 | 60,155 |
| 3. දැව හා දැව නිෂ්පාදිත | 628 | 145 | 1,074 | 158 |
| 4. කඩදසි හා කඩදසි නිෂ්පාදිත,මුද්‍රණ සහ ප්‍රකාශන | 276 | 155 | 459 | 602 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 10,349 | 4,114 | 13,378 | 6,206 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 7,270 | 3,410 | 8,146 | 4.466 |
| 7. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 609 | 297 | 887 | 311 |
| 8. අන් තැනක සඳහන් නොවූ නිෂ්පාදිත | 21,182 | 7,012 | 23,433 | 8,842 |
| 9. සේවා (ඇ) | 8,805 | 1,879 | 10,047 | 3,042 |
| එකතුව | 179,878 | 76,740 | 205,660 | 86,814 |

මූලය : ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය.

(අ) තාවකාලික.
(ආ) ඇස්තමේන්තු කළ.
(ඇ) එයාර් ලංකා හැර.

1994 අවසාන වන විට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ඇති ව්‍යවසායයන්හී අපේක්ෂිත මුළු ආයෝජන ප්‍රමාණය රුපියල් දශලක්ෂ 43,262 ක් වූ අතර මෙයින් සියයට 57 ක් දේශීය ආයෝජනයන් විය. ජපානය, දකුණු කොරියාව, තායිවානය, ජර්මනිය, කුවේට්, ප්‍රංශය, මලයාසියාව, සිංගප්පූරුව, ඕස්ට්‍රේලියාව, එක්සත් රාජධානිය, ඉතාලිය, ඇමරිකා එක්සත් ජනපදය, තායිලන්තය සහ ඉන්දියාව වැනි රට වලින් විදේශ ආයෝජකයෝ පැමිණියහ. 1994 වසරේදී ශ්‍රී ල. අ. ම. විසින් අනුමත කරන ලද ව්‍යාපෘතින් අතර රබර් මිශ්‍රිත නිෂ්පාදිත, ලීයෙන් තැනූ සෙල්ලම් බඩු, පිහන් මැටි වලින් සෑදූ ප්‍රතිමා, ගෑස් සිලින්ඩර්, ඖෂධීය නිෂ්පාදිත, පළතුරු සහ එළවළු සකස් කිරීම, පිරිසිදු කළ ජලය බෝතල් කිරීම සහ සිලිකා ක්වාට්ස් සකස් කිරීමේ කර්මාන්ත ඇතුලත්වේ.

1994 වසරේදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය දේශීය ආදයම් පනත සහ බදු සම්බන්ධිත නීති (සාමාන්‍ය දිරි දීමනා යෝජනා ක්‍රමය) යටතේ ව්‍යවසායයන් 26 ක් අනුමත කරන ලදී. මෙම ව්‍යාපෘතීන්හි අපේක්ෂිත මුළු ආයෝජන ප්‍රමාණය රුපියල් දශලක්ෂ 7,403 ක් වූ අතර එහි විදේශ ආයෝජන දයකත්වය රුපියල් දශලක්ෂ 4,395 ක් සහ දේශීය ආයෝජන දයකත්වය රුපියල් දශලක්ෂ 3,007 ක් විය. මෙම ව්‍යාපෘතිවල අපේක්ෂිත සේවා නියුක්තිය පුද්ගලයින් 7,395 ක් විය.

ඇඟළුම් කම්හල් 200 වැඩපිළිවෙලද ඇතුළුව 1993 දී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ව්‍යවසායයන්ට අයත් දළ අපනයන ඉපැයුම් ප්‍රමාණය වූ රුපියල් දශලක්‍ෂ 76,740, (විගැහි දශ ලක්‍ෂ 1,145) සමඟ සසඳන කල එය 1994 දී රුපියල් දශලක්‍ෂ 86,815 (විගැහි දශලක්ෂ 1,223) විය. මෙය රුපියල් දශලක්ෂ 10,075 ක් හෙවත් සියයට 13 ක වැඩිවීමකි. විගැහි අගය අනුව මෙම වර්ධනය සියයට 7 කි. 1994 දී රෙදිපිළි, නිමි ඇඳුම් සහ සම් භාණ්ඩ නිෂ්පාදනයන්ගේ

දළ රුපියල් අපනයන වටිනාකම සියයට 6 කින් වැඩි වූ අතර 1993 දී එහි වැඩිවීම සියයට 86 ක් විය. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ව්‍යවසායයන්ගේ මුළු අපනයන ඉපැයීම් වලින් සියයට 69 කට දායකත්වයක් සපයමින් මෙම අංශය තවදුරටත් විදේශ විනිමය ඉපැයීමේ ප්‍රධානියා වශයෙන් ක්‍රියාත්මක විය. රසායනික ද්‍රව්‍ය, ප්ලාස්ටික් නිෂ්පාදන; ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන; ආහාර සහ පාන වර්ග යනාදි කාර්මික ගණයයන් ඇඟළුම් නොවන අපනයන අංශයේ සැලකිය යුතු අපනයන ඉපැයුම් වර්ධනයක් පෙන්නුම් කර ඇත.

1994 වසර තුලදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මලයාසියාව, සිංගප්පූරුව, ජපානය, දකුණු කොරියාව, දකුණු අප්‍රිකාව සහ එක්සත් රාජධානිය යන රටවල ආයෝජන ප්‍රවර්ධන කිරීමේ ප්‍රචාරාත්මක කාර්යයන්හි නිරත විය. ඉලෙක්ට්‍රොනික් සහ කෘෂිකාර්මික යන අංශවලට ආයෝජකයන් උනන්දු කරවීම සඳහා සම්මන්ත්‍රණ දෙකක් ශ්‍රී ලංකාවේ දී පවත්වන ලදී.

## ඇඟළුම් කර්මාන්ත අංශය

ඇඟළුම් කර්මාන්තය විවිධ වර්ගවල ඉතා උසස් තත්වයේ ඇඟළුම් නිපදවමින් ශ්‍රී ලංකාවේ ප්‍රධාන නිර්යාත කර්මාන්තය බවට පත්ව ඇත. කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශයේ සහ ආයෝජන මණ්ඩලයේ දත්තවලට අනුව 1994 වර්ෂය අවසානය වන විට ඇඟළුම් කර්මාන්තශාලා 687 ක් නිෂ්පාදන කටයුතුවල නියැලී සිටියහ. මෙයින් කර්මාන්තශාලා 375 ක් කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කර තිබූ අතර කර්මාන්තශාලා 312 ක් සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පහසුකම් සපයන ලදි. ආයෝජන මණ්ඩලය පහසුකම් සපයන ලද ව්‍යවසායයන් අතර ඇඟළුම් කර්මාන්තශාලා 200 වැඩසටහන යටතේ පිහිටුවන ලද ඇඟළුම් කර්මාන්ශාලා 165 ද ඇතුලත් විය. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ (විශේෂ දිරිගැන්වීම් යෝජනාක්‍රමය) කර්මාන්ත ශාලා 97 ක් අනුමත කර ඇත. එමෙන්ම ආයෝජන මණ්ඩල පනතේ 16 වගන්තිය යටතේ (සාමාන්‍ය දිරි ගැන්වීම් යෝජනා ක්‍රමය) කර්මාන්තශාලා 50 ක් ක්‍රියාත්මකව පැවතුනි.

ඇඟළුම් කර්මාන්ත අංශය මගින් ග්‍රාමීය තරුණ තරුණියන්ට සපයා ඇති සෘජු රැකියා අවස්ථාවන් ප්‍රමාණය 2,25,000 පමණ වේ. ඇඟළුම් නිර්යාත 1990 දී ශ්‍රී ලංකාවේ මුළු නිර්යාත ඉපැයීම් වලින් සියයට 31 ක් හෙවත් රුපියල් දශලක්ෂ 24,287 ක් විය. මෙම ප්‍රමාණය 1994 දී ශ්‍රී ලංකාවේ මුළු නිර්යාත ඉපැයීම් වලින් සියයට 44 හෙවත් රුපියල් දශලක්ෂ 68,945 දක්වා වැඩි විය. 1994 වර්ෂයේ මුළු අපනයන ඉපැයුම් වලින් තේ, රබර් සහ පොල් අංශ තුනේ දායකත්වය සියයට 22 ක් පමණක් විය. දශක කිහිපයක් පුරා සම්ප්‍රදායක කෘෂිකාර්මික අපනයන මත සම්පූර්ණයෙන්ම රැඳී තිබුණ ශ්‍රී ලංකාවේ අපනයන ව්‍යුහය ඇඟළුම් කර්මාන්තයෙහි ඇති වූ ප්‍රසාරණය නිසා විවිධාංගීකරණයට පත් විය. 1986 වර්ෂයේ සිට තේ දෙවන ස්ථානයට පත් කරමින් මෙම කර්මාන්තය ප්‍රධාන දළ විදේශ විනිමය උපයන්නා බවට පත්ව ඇත.

මෑත කාලයේදී ඇඟළුම් කර්මාන්තය තුළින් ඉහළ තරඟකාරිත්වයක් සමඟ පරිනත බවක් ප්‍රදර්ශනය විය. 2005 වර්ෂය වන විට රෙදිපිළි සහ ඇඳුම් පැළඳුම් සම්බන්ධව පූර්ණ නිදහස් වෙළෙඳපොළක් ඇති කිරීමේ පරමාර්ථයෙන් උරුගුවේ වෙළෙඳ ගිවිසුම යටතේ අවුරුදු 10 ක් ඇතුලත විවිධ කෙඳි වර්ග පිළිබඳ ගිවිසුම අවලංගු කිරීමට ඉඩ ඇති අතර ඒ නිසා උද්ගත විය හැකි ජාත්‍යන්තර තරඟකාරිත්වයට මුහුණදීමේ හැකියාව වැඩිදියුණු කිරීම මෙම කර්මාන්තය වර්තමානයේ මුහුණ දෙන ප්‍රධාන අභියෝගය වේ.

ඉතාමත් තරඟකාරී නූතන වෙළෙඳපොළ වලට ඇතුළුවීමේ හැකියාව තුළින් ශ්‍රී ලංකාවේ ඇඟළුම්වල උසස් තත්ත්වය සහ මිළ තරඟකාරිත්වය පිළිබිඹු විය. ශ්‍රී ලංකාවේ ඇඟළුම් නිෂ්පාදන වලින් සියයට 92 ක් පමණ ඇමරිකා එක්සත් ජනපදයට සහ යුරෝපා ආර්ථික හවුලේ රටවලට අපනයනය කරනු ලබයි. 1994 වර්ෂයේදි ශ්‍රී ලංකාවේ මුළු අපනයන වලින් සියයට 61 ක් ආනයන කරමින් ඇ. එ. ජනපදය ප්‍රධාන ආනයනකරුවා බවට පත්විය. යුරෝපා ආර්ථික හවුලේ රටවල් සියයට 32 ක් ආනයනය කරමින් දෙවන ස්ථානයට පත්ව ඇත. ඇඟළුම් අපනයකරුවන් ප්‍රවිෂ්ඨවී ඇති අනෙකුත් වෙළෙඳපොළවල් වනුයේ කැනඩාව, ජපානය සහ දකුණු කොරියාවයි.

1.25 සංඛ්‍යා සටහන

## ඇමරිකා එක්සත් ජනපද පංගු උපයෝජනය
## 1994 ජනවාරි - දෙසැම්බර්

| පංගු අංක | භාණ්ඩ වර්ගය | ඒකකය | ලැබී ඇති පංගු ප්‍රමාණය | උපයෝජනය | උපයෝජන ප්‍රතිශතය % |
|---|---|---|---|---|---|
| 237 | ක්‍රීඩා ඇඳුම් | දුසිම් | 267,674 | සම්පූර්ණයෙන් භාවිතා කර ඇත. | |
| 331/631 | අත්වැසුම් සහ අත් මේස් | දුසිම් | 3,330,773 | 3,121,553 | 93.72 |
| 333/633 | සූට් | දුසිම් | 29,041 | 5 | 0.02 |
| 334/634 | වෙනත් කබා | දුසිම් | 867,071 | 776,946 | 89.61 |
| 335/835 | කබා | දුසිම් | 334,700 | 290,829 | '86.89 |
| 336/636/836 | ඇඳුම් | දුසිම් | 658,706 | 606,465 | 92.07 |
| 338/339 | කමිස සහ හැට්ට | දුසිම් | 1,344,752 | සම්පූර්ණයෙන් භාවිතා කර ඇත. | |
| 340/640 | කමිස | දුසිම් | 1,343,974 | 1,225,673 | 91.20 |
| 341/641 | බ්ලවුස් | දුසිම් | 1,868,738 | සම්පූර්ණයෙන් භාවිතා කර ඇත. | |
| 345/845 | ස්වීටර්ස් | දුසිම් | 113,332 | 77,671 | 68.53 |
| 347/348/847 | දිග හා කොට කලිසම් | දුසිම් | 1,573,138 | සම්පෘර්ණයෙන් භාවිතා කර ඇත. | |
| 350/650 | ගවුම් | දුසිම් | 59,280 | 56,875 | 95.94 |
| 351/651 | රාත්‍රි ඇඳුම් හා පිජාමාස් | දුසිම් | 338,285 | සම්පූර්ණයෙන් භාවිතා කර ඇත. | |
| 352/652 | යට ඇඳුම් | දුසිම් | 1,329,966 | 1,327,399 | 99.81 |
| 359ඩී/659ඩී | ආරක්‍ෂක කබා | කි.ග්‍රෑ. | 960,102 | සම්පූර්ණයෙන් භාවිතා කර ඇත. | |
| 360 | කොට්ට උර | සංඛ්‍යාව | 1,200,000 | 1,101,368 | 91.78 |
| 363 | තුවා රෙදි සහ අනෙකුත් සිනිඳු තුවා | සංඛ්‍යාව | 7,881,596 | 3,673,688 | 46.61 |
| 368-ඩී | ඩිෂ් ටවල් | කි.ග්‍රෑ. | 728,248 | 189,847 | 26.14 |
| 369-එස් | ෂොප් ටවල් | කි.ග්‍රෑ. | 689,784 | 492,347 | 71.38 |
| 435 | කබා | දුසිම් | 15,750 | 15,226 | 96.67 |
| 635 | කබා | දුසිම් | 461,873 | 406,992 | 88.12 |
| 638/639/838 | කමිස සහ බ්ලවුස් | දුසිම් | 758,023 | 568,291 | 74.97 |
| 644 | සූට් | සංඛ්‍යාව | 258,635 | 76,152 | 29.44 |
| 645/646 | ස්වීටර්ස් | දුසිම් | 45,526 | 7,219 | 15.86 |
| 647/648 | දිග සහ කොට කලිසම් | දුසිම් | 777,128 | 726,443 | 93.48 |
| 840 | සේද වලින් මසනු නොලැබූ කමිස සහ බ්ලවුස් | | 250,000 | 248,949 | 99.58 |

මූලය : කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය.

## 1.26 සංඛ්‍යා සටහන
## යුරෝපා ආර්ථික හවුලේ රටවල පංගු උපයෝජනය

| පංගු අංක | භාණ්ඩ වර්ගය | ඒකකය | පංගු ප්‍රමාණය | පංගු උපයෝජනය | පංගු උපයෝජන ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| 6 | පිරිමි හෝ ළමුන්ගේ මැසූ කලිසම්, දිග හා කොට කලිසම්, කාන්තා හෝ ගැහුණු ළමුන්ගේ කලිසම් සහ දිගකලිසම් | කැලි | 6,252,240 | 5,552,174 | 89 |
| 7 | කාන්තා හෝ ගැහැණු ළමුන්ගේ බ්ලවුස්, ෂර්ට්ස්, සහ ෂර්ට් බ්ලවුස් | කැලි | 10,824,160 | සම්පූර්ණයෙන් භාවිතා කර ඇත. | |
| 8 | පිරිමි හෝ පිරිමි ළමුන්ගේ කමිස, ගොතන ලද හෝ මැසූ හැර | කැලි | 7,487,072 | සම්පූර්ණයෙන් භාවිතා කර ඇත. | |
| 21 | විවිධ වර්ගයේ උණුසුම් ඇඳුම් | කැලි | 6,789,610 | 2,915,750 | 43 |

මූලය : කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය.

## 1.27 සංඛ්‍යා සටහන
## කැනඩාවේ පංගු ප්‍රමාණයන් උපයෝජනය
## 1994 ජනවාරි - දෙසැම්බර්

| අංශ අංක | නිෂ්පාදන භාණ්ඩ පිළිබඳ විස්තර | ඒකකය | පංගු ප්‍රමාණය | උපයෝජනය | උපයෝජන ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| 1.0 | කබා, සහ වැහි කබා | කැලි | 888,061 | 723,075 | 81 |
| 1.1 | ආවරණ කබා | කැලි | 111,618 | 62,063 | 56 |
| 2.0 | හිම කබා | කැලි | 210,986 | සම්පූර්ණයෙන් භාවිතා කර ඇත. | |
| 3/4 | පිරිමි සිනිඳු ඇඳුම් | කැලි | 768,395 | 412,636 | 54 |
| 3.1 | සිනිඳු ඇඳුම් කට්ටල | කැලි | 23,532 | 3,654* | 16 |
| 5.0 | දිග සහ කොට කලිසම් | කැලි | 794,081 | 700,578 | 88 |
| 6.0 | මසන ලද කමිස | කැලි | 708,598 | සම්පූර්ණයෙන් භාවිතා කර ඇත. | |
| 7/8 | වියන ලද කමිස සහ බ්ලවුස් | කැලි | 1,405,425 | 1,139,644 | 81 |
| 8.1 | කමිස බ්ලවුස් සහ සමාන ඇඳුම් | කැලි | 618,525 | 20,147 | 03 |
| 9.0 | යට ඇඳුම් | කැලි | 1,013,543 | සම්පූර්ණයෙන් භාවිතා කර ඇත. | |
| 10.0 | නිදන ඇඳුම් හා ටවල් | කැලි | 588,300 | 344,841 | 59 |
| 11.0 | ස්වීටර්ස් | කැලි | 228,479 | 22,572 | 10 |
| 12.0 | පිහිනුම් ඇඳුම් | කැලි | 503,366 | 73,921 | 15 |
| 14.0 | ළදරු ඇඳුම් | කැලි | 294,150 | 199,975 | 68 |
| 41.0 | ඇඳ ඇතිරිලි සහ කොට්ට උර | කැලි | 543,008 | 13,200* | 02 |
| 44.1 | කාර්මික අත් වැසයුම් | ජෝඩු | 3,693,013 | 3,028,928 | 82 |

* 1994 නොවැම්බර් තුළදී අපනයන කර ඇත.

මූලය : කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය.

ඇ. එ. ජනපදය, යුරෝපා ආර්ථික හවුලේ රටවල් සහ කැනඩාව සම්බන්ධයෙන් ලබාගත හැකි ඇඟළුම් පංගු ප්‍රමාණයන් සහ ඒවායේ උපයෝජන අනුපාතයන් පිළිවෙලින් 1.25, 1.26 සහ 1.27 සංඛ්‍යා සටහන්වල දක්වා ඇත.

ඇඟළුම් කර්මාන්තශාලා 200 වැඩසටහන යටතේ 1994 දෙසැම්බර් අවසානය වන විට පුද්ගලයින් 71,088 පමණ රැකියා අවස්ථා සපයමින් ව්‍යවසායයන් 165 ක් ක්‍රියාත්මකව පැවතුනු අතර ව්‍යවසායයන් 9 ක් කර්මාන්ත ආරම්භ කිරීමේ විවිධ අවස්ථාවන්හි නිතරව සිටියහ. මෙම වැඩසටහනට පෞද්ගලික අංශය විසින් යොදවන ලද ප්‍රාග්ධනය රුපියල් දශලක්ෂ 5,380 ක් බවට ඇස්තමේන්තු කර ඇත. 1994 වර්ෂය තුලදී මෙම ව්‍යවසායන්ගේ අපනයන ඉපැයීම් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 32,424 ක් හෙවත් ආයෝජන මණ්ඩලය යටතේ ඇති රෙදිපිළි සහ ඇඟළුම් කර්මාන්තවලින් ලැබූ මුළු අපනයන වලින් සියයට 54 ක් විය.

## නව කර්මාන්තවල ප්‍රාදේශීය ව්‍යාප්තිය

ප්‍රාදේශීය සංවර්ධන අරමුණෙන් සහ කර්මාන්ත විශාල වශයෙන් කොළඹ දිස්ත්‍රික්කය තුළ ඒකරාශී වීමේ අහිතකර ප්‍රතිවිපාක ඉවත් කිරීමේ අරමුණෙන් ග්‍රාමීය අංශයේ කාර්මික කටයුතු නගා සිටුවීමේ ප්‍රතිපත්තිය තවදුරටත් ගෙන යන ලදී. කර්මාන්ත සංවර්ධන අමාත්‍යංශය යටතේ ලියාපදිංචි කරන ලද කර්මාන්තශාලා වලින් කර්මාන්ත 346 ක් හෙවත් ක් සියයට 23 ක් කොළඹ දිස්ත්‍රික්කයෙන් පිටත පිහිටා තිබුණි.

1994 අවසානය වන විට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ව්‍යාපෘතීන් 442 ක් ක්‍රියාත්මක වෙමින් පැවතුනු අතර, කටුනායක සහ බියගම ආයෝජන ප්‍රවර්ධන කලාපවල ඇති ඉහළ යටිතල පහසුකම් හේතුවෙන් මෙම ව්‍යවසායයන්ගෙන් සියයට 79 ක් හෙවත් ව්‍යවසායයන් 348 ක් කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවල ඒකරාශී වී තිබුණි. කොග්ගල ආයෝජන ප්‍රවර්ධන කලාපය නිසා ව්‍යාපෘතීන් 21 ක් ගාල්ල දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක විය.

1994 වසර අවසන් වන විට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 16 වගන්තිය සාමාන්‍ය දිරිගැන්වීම් යෝජනනා ක්‍රමය) යටතේ ව්‍යාපෘතීන් 349 ක් ක්‍රියාත්මක වෙමින් පැවතුණි. කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවල ඇති ඉහළ යටිතල පහසුකම් හේතුවෙන් මෙම ව්‍යවසායයන්ගෙන් 280 ක් හෙවත් සියයට 80 ක් මෙම දිස්ත්‍රික්කවල පිහිටුවා තිබුණි. ත්‍රිකුණාමලය, මොණරාගල, මාතලේ, වවුනියාව, මාතර සහ හම්බන්තොට වැනි දුෂ්කර ප්‍රදේශවල ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ව්‍යවසායයන් ස්ථානගත වී තිබීමද කැපී පෙනෙන ලක්ෂණයක් විය. ඇඟළුම් කම්හල් 200 වැඩපිළිවෙල යටතේ දිස්ත්‍රික්ක 21 ක් තුළ ඇඟළුම් කම්හල් 165 ක් ක්‍රියාත්මක විය. මෙයින් කම්හල් 142 ක් කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්ක වලින් පිටත පිහිටුවා තිබුණු අතර අනුරාධපුර, කුරුණෑගල, පුත්තලම, මහනුවර සහ රත්නපුර යන දිස්ත්‍රික්කවල පිහිටුවා තිබුණු කර්මාන්තශාලා ගණන පිළිවෙලින් 15,11,13,12 සහ 15 බැගින් විය.

## 1.28 සංඛ්‍යා සටහන
# නව කර්මාන්තයන්හි ප්‍රාදේශීය ව්‍යාප්තිය

(සංඛ්‍යා වලිනි)

| දිස්ත්‍රික්කය | කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවත්නා කර්මාන්තයන් (අ) | ශ්‍රී ලංකා ආයොජන මණ්ඩලය යටතේ පවත්නා කර්මාන්ත (ආ) | | | එකතුව |
|---|---|---|---|---|---|
| | | 17 වන වගන්තිය | 16 වන වගන්තිය | ඇඟළුම් කම්හල් 200 වැඩපිළිවල | |
| 1. කොළඹ | 1,165 | 130 | 203 | 16 | 1,514 |
| 2. ගම්පහ | 163 | 218 | 77 | 7 | 465 |
| 3. කළුතර | 41 | 15 | 15 | 10 | 81 |
| 4. ගාල්ල | 23 | 21 | 14 | 6 | 64 |
| 5. මහනුවර | 29 | 11 | 8 | 12 | 60 |
| 6. පුත්තලම | 15 | 14 | 10 | 13 | 52 |
| 7. කුරුණෑගල | 9 | 11 | 8 | 11 | 39 |
| 8. හම්බන්තොට | 19 | 1 | 1 | 7 | 28 |
| 9. මාතර | 20 | 1 | 1 | 4 | 26 |
| 10. බදුල්ල | 8 | 4 | 3 | 9 | 24 |
| 11. රත්නපුර | 1 | 4 | 3 | 15 | 23 |
| 12. අනුරාධපුරය | 4 | 1 | 1 | 15 | 21 |
| 13. නුවරඑළිය | 3 | 5 | 3 | 9 | 20 |
| 14. කෑගල්ල | 2 | 3 | - | 8 | 13 |
| 15. මාතලේ | 4 | 1 | - | 5 | 10 |
| 16. අම්පාර | 4 | - | - | 5 | 9 |
| 17. මොනරාගල | 1 | - | 1 | 5 | 7 |
| 18. පොළොන්නරුව | - | 2 | - | 4 | 6 |
| 19. වවුනියාව | - | 1 | - | 2 | 3 |
| 20. ත්‍රිකුණාමලය | - | - | 1 | 1 | 2 |
| 21. මඩකලපුව | - | - | - | 1 | 1 |
| එකතුව | 1,511 | 443 | 349 | 165 | 2,468 |

(අ) 1993.12.31 දක්වා.
(ආ) 1994.12.31 දක්වා.

මූලය : කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය.